**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2017**

**-----------------------------------------------------**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ අංක 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත වටිනාකම රු.29,091,561 ක් වූ 2017 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර නොතිබුණු ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කර්යාල 04 ක් වෙත ගෙවා තිබුණු රු.9,185,679 ක මුදල, මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට දේපළ පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංචිත යටතේ දක්වා තිබුණු රු.308,559,783 ක් වූ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ රු.675,361,071 ක් ලෙස දක්වා තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

ඇස්තමේන්තු ගත වටිනාකම රු.2,060,785 ක් වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙල්ජියම් නිවාස පද්ධතියේ කොටසක කාණු පද්ධතිය අළුත් වැඩියාව සහ අවශ්‍ය ස්ථානවල බෝක්කු ඉදිකිරීමේ වැඩ විෂයන් 2 ක් සම්බන්ධයෙන් අදාල විස්තරාත්මක දල සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

**පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| | නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 05 ඡේදය | පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂිකව අවම වශයෙන් කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 04 ක් වත් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුණේ රැස්වීම් වාර 02ක් පමණි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i). 3.4.3 මාර්ගෝපදේශය | මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 5.3.11 (අ) මාර්ගෝපදේශය | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.23,228,675 වු ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 09 ක් සඳහා ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104 (3) | 2015 වර්ෂයේ සිට 2018 මැයි 30 දක්වා සිදු වු වාහන අනතුරු 17 ක් සඳහා ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | මධ්‍යස්ථානය විසින් නිකුත්කළ අංක 2017/01 හා 2017 පෙබරවාරි 21 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 03 ඡේදය | ව්‍යාපෘතියක් තෝරාගැනීමේදී මහජන විරෝධතාවන් අවම වන පරිදි හා වරින් වර සංශෝධනයන් කිරීමට සිදු නොවන ආකාරයෙන් ව්‍යාපෘති තෝරා ගත යුතු වුවත්,ඇස්තමේන්තුගත වටිනාකම රු.85,213,525 ක් වු දිස්ත්‍රික් 08 ක ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු ව්‍යාපෘති 16 ක් මහජන විරෝධතා හේතුවෙන් 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 62,963,156 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 6,159,474 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.56,803,682 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වර්ෂයේ ආදායම රු.77,935,871 කින් වැඩි වුවද පරිපාලන වියදම රු.138,275,300 කින් වැඩිවීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.9,452,720 ක ඌණතාවයක් පැවතියද 2014 වර්ෂයේදී රු.2,616,061 ක අතිරික්තයක් ඇති වී තිබුණු අතර නැවත 2015, 2016, හා 2017 වර්ෂවල පිළිවෙලින් රු.12,255,473, රු.6,159,474, රු.62,963,156 ඌණතාවයක් ද ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වු ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.274,159,353 ක් වූ දායකත්වය 2014 වර්ෂයේදී වර්ධනය වී 2015 වර්ෂයේදී පිරිහිමකට ලක් වී තිබුණද නැවත 2016 වර්ෂයේ සිට වර්ධනය වී 2017 වර්ෂයේදී රු.261,166,505 ක් වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යය සාධනය

------------------

#### 4.1.1 සැලසුම් කිරීම

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සංශෝධන කටයුතු 2008 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණ ද 2017 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ඡේදයේ 2 (අ) පරිදි මධ්‍යස්ථානය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කළ යුතු අතර ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2017 වර්ෂයේදී රු.මිලියන 02 ක් මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණි. ඒ අනුව 2018 - 2030 දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් නව සැලැස්මක් පිළියෙල කිරීම 2017 මාර්තු 07 දින ආරම්භකර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තරව පිළිගත් සෙන්දායි රාමුව අනුව ආපදා අවදානම අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී මධ්‍යස්ථානයට ලබාදුන් රු.1,300,000 ක මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට මධ්‍යස්ථානය විසින් රු.318,582 ක් වැය කර තිබුණද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. උක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු අමාත්‍යාංශය විසින් ඉටු කළයුතු බව මධ්‍යස්ථානය විසින් ඉකුත් වර්ෂයේදී විගණනයට දන්වා තිබුණ ද අමාත්‍යාංශය විසින් ද එවැනි සැලැස්මක් පිළියෙල කිරීමට 2017 දෙසැම්බර් 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි.

**4.1.2 ක්‍රියාකාරීත්වය සමාලෝචනය**

-----------------------------------

මධ්‍යස්ථානයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ ඇති වූ ගං වතුර ආපදා තත්ත්වය හේතුවෙන් කොළඹ, ගම්පහ සහ මාතර දිස්ත්‍රික්කවල විපතට පත් පුද්ගලයින් සංඛ්‍යාව පිළිවෙලින් 1,095 ක් 10,408 ක් හා 4,596 ක් වී තිබුණු අතර 2016 වර්ෂයේදී ගං වතුරින් විපතට පත් වූ සංඛ්‍යාවන් පිළිවෙලින් 255,188 ක් 138,045 ක් හා 6,583 ක් වී තිබුණි. කෙසේ වුවද මෙම දිස්ත්‍රික්කවල ගං වතුර ආපදා අවදානම නිසි පරිදි තක්සේරු කර නොතිබීම හේතුවෙන් 2017 වර්ෂය සඳහා එම දිස්ත්‍රික්ක වෙනුවෙන් කිසිදු මුදලක් ප්‍රතිපාදනය කර නොතිබුණි.

තවද ඉහත දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති වූ ගං වතුර ආපදා තත්ත්වය හේතුවෙන් විපතට පත් පුද්ගලයන් සංඛ්‍යාව අවම මට්ටමක එනම් 2015 වර්ෂයේදී 556 ක් හා 2016 වර්ෂයේ දී 12,048 ක් වුව ද සමාලෝචිත වර්ෂය තුළ දී ගං වතුර ආපදා අවම කිරීම් වෙනුවෙන් රු.354,434,069 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 176 කින් ව්‍යාපෘති 87 ක් එනම් මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 49 ක් සඳහා මුළු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් එනම් රු.73,913,285 වැය කර කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර තිබුණි.එසේ වුවද වැඩි සංඛ්‍යාවක් ආපදාවට ලක් වූ ගාල්ල, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක සඳහා වෙන් කර තිබුණේ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 2.5 සිට සියයට 8 දක්වා වූ ප්‍රමාණයක් පමණකි. ඊට අමතරව ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 11 ක් වෙනුවෙන් රු.12,809,434 ක් හා වර්ෂාවෙන් මාර්ග අබලන් වීම් අවම කිරීමේ ව්‍යාපෘති 12 වෙනුවෙන් රු.22,006,835 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර එම ව්‍යාපෘති සියල්ලම කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ගං වතුර, නියඟය, නාය යෑම්, සත්ව උවදුරු හා හදිසි ආපදා වශයෙන් නම්කර තිබූ ප්‍රධාන ආපදා වර්ග 05 ක් අවම කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහාවූ අයවැය ඇස්තමේන්තු මගින් රු.මිලියන 480 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණි. විගණනයට ලබා දී තිබූ තොරතුරු අනුව සත්ව ප්‍රහාර හේතුවෙන් 2016 හා 2017 වර්ෂ තුළදී සිදු වූ පුද්ගල මරණ සංඛ්‍යාව පිළිවෙලින් 68 ක් සහ 58 ක් වශයෙන් ද, ඉන් විපතට පත් පුද්ගල සංඛ්‍යාව 2,043 ක් සහ 6,947ක් ද වශයෙන්ද සඳහන් වී තිබුණද ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදනය කරන ලද මුළු මුදල රු.මිලියන 1.78 ක් එනම් එක් පුද්ගලයෙකු වෙනුවෙන් රු.254 පමණක් විය. ඒ අනුව සත්ව උවදුරු වලින් සිදු වන ආපදා අවම කිරීම සම්බන්ධයෙන් මධ්‍යස්ථානය විසින් නිසි බර තැබීමක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මධ්‍යස්ථානය විසින් ලබාදී තිබුණු උපදෙස් අනුව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අදාල ව්‍යාපෘතිවල කටයුතු අවසන් වූ වහාම වැඩ අවසන් වාර්තා මධ්‍යස්ථානය වෙත එවිය යුතු අතර ඒ මත පදනම්ව අවසන් ගෙවීම් සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් විගණිත දිනය වූ 2018 පෙබරවාරි 17 වන විටත් අවසන් වැඩ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු ව්‍යාපෘති 08 ක් සඳහා රු.13,507,644 ක් ගෙවා තිබුණි.

(ඇ) අනුරාධපුර, බදුල්ල, නුවරඑළිය, කොළඹ හා කුරුණෑගල යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.42,185,609 ක් වූ ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.4,512,287 ක අත්තිකාරම් ලබා දී තිබුණ ද විවිධ කරුණු හේතුවෙන් එම ව්‍යාපෘති අතරමග නවතා තිබුණි. කෙසේ වුවද අත්තිකාරම් මුදල් නැවත මධ්‍යස්ථානය වෙත ප්‍රේෂණය කර තිබුණේ උක්ත ව්‍යාපෘති නැවැත්වූ දින සිට මාස 1 ½ ත් මාස 8 ½ ත් දක්වා වූ කාලයක් ප්‍රමාදවීමෙන් පසුවය.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරණු ලැබේ.

(i) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැසුමට අනුව ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම යටතේ හදිසි මෙහෙයුම් අංශය සඳහා හයිබ්‍රිඩ් නිවාස දෙකක් රු.මිලියන 1.2 ක ප්‍රතිපාදන මත මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද එකී කාර්යය ඉටු කිරීම සඳහා මිල ගණන් කැඳවීම ප්‍රමාද වීම හේතුවෙන් අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි එකී ප්‍රසම්පාදනය අත්හිටුවා තිබුණි.

(ii) ප්‍රසම්පාදන සැලැස්මට අනුව හදිසි ගං වතුර ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා 2017 අයවැය ප්‍රතිපාදන මත බෝට්ටු එන්ජින් 125 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණ ද ලංසු ඇගයීමේ ක්‍රියාවලියේදී මතු වූ ගැටළු සහගත තත්ත්වය හේතුවෙන් 2017 දෙසැම්බර් 08 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි එකී ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.1,034,399,368 ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2010 වර්ෂයේදී ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් සිදු කර නොතිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මගින් 2005 සහ 2006 වර්ෂ තුළදී යතුරු පැදි 07 ක් ද, 2015 වර්ෂය තුළදී යතුරු පැදි 02 ක් ද සහ ලියාපදිංචි සහතික ඉදිරිපත් නොකල යතුරුපැදි 09 ක් ද වශයෙන්, මධ්‍යස්ථානය වෙත ලැබී තිබුණු යතුරු පැදි 18 ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ඒවායේ ධාවන තත්ත්වය, භාරකාරත්වය පිළිබඳ වගකියනු ලබන පාර්ශවයන් යනාදී කරුණු සම්බන්ධ පසු විපරම් පරීක්ෂාවක් මධ්‍යස්ථානය විසින් සිදු කර නොතිබුණු අතර උක්ත වත්කම් අයථා පරිහරණය මෙන්ම වත්කමේ පැවැත්ම පිළිබඳවද ගැටළු ඇති වී තිබුණි.

(ඇ) 2017 වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණු හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත් කර නොතිබුණු මෝටර් වාහන දෙකක් අවුරුදු 05 ක කාල සිමාවක් සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ සපයා ගැනීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 11 දින එළඹෙන ලද ගිවිසුමේ 7 (ඇ) ඡේදය ඒකපාර්ශවිකව කඩ කිරීම හේතුවෙන් රු.3,293,941 ක දඩ මුදලක් ගෙවන ලෙස සැපයුම්කාර ආයතනය විසින් මධ්‍යස්ථානය වෙත 2018 මැයි 23 දින ලිඛිතව දැනුම් දී තිබුණි. එසේම 2016 පෙබරවාරි 23 දින සිට 2018 ජුනි 30 දින වන තෙක්ම පුරප්පාඩු වී පැවති තනතුරු 02 ක් පිරවීමට කටයුතු කිරීමෙන් තොරව එම තනතුරු වෙනුවෙන් අනුයුක්ත කිරීමට මෙම වාහන සපයාගෙන තිබුණු බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඇ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අංග සම්පූර්ණ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් 2015 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව මගින් රු.මිලියන 123 ක් ද 2017 වර්ෂයේ පරිපූරක ප්‍රතිපාදන මගින් රු.මිලියන 50 ක් ද වෙන්කර තිබුණ ද මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා සුදුසු ඉඩමක් සොයාගත නොහැකිවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන තෙක් ක්‍රියාත්මක වී නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ කාර්යයන් යටතේ මිලදී ගන්නා ලද වටිනාකම රු.7,166,319 ක් වූ උපකරණ වර්ග 10 ක් සහ වටිනාකම රු.6,264,973 ක් වූ ස්ථාවර වත්කම් වර්ග 09 ක් ද, විවිධ ආයතන වලින් මධ්‍යස්ථානය වෙත ප්‍රදාන ලෙස ලැබුණු පොත් පත් සහ වීඩියෝ පට විශාල ප්‍රමාණයක් ද, වර්ෂ 01 සිට වර්ෂ 3 ½ දක්වා වූ කාලයක් තුළ නිෂ්කාර්යව ගබඩාවේ පැවති අතර රු.110,100 වටිනා කැනීම් යන්ත්‍ර ටයර් 02 ක් ද වසර 08 කට ආසන්න කාලයක් ගබඩාවේ ඌණ උපයෝජිතව පැවතුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

2016 අගෝස්තු 25 දින සිට මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මුදල් හා අධ්‍යක්ෂ මානව සම්පත් තනතුරු පුරප්පාඩුව පැවති අතර එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට 2018 ජුනි 05 දින පවත් වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා සුදුසු පුද්ගලයෙකු නිර්දේශ කර තිබුණ ද මධ්‍යස්ථානය විසින් එම පුරප්පාඩුව පුරවා නොතිබුණි. එසේ වුවද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කමිටුවේ අනුමැතිය ද රහිතව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MDM/AD/05/DMC/NR(D)/VOL -III -2017 දරණ පිළිවෙලින් 2018 ජූලි 18 දින හා 2018 ජූලි 26 දින නිකුත් කරන ලද ලිපි දෙකක් මගින් උක්ත තනතුරු දෙකෙහි වැඩ බැලීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි.

**5 තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත්ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6 ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

------------------------------------------

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

--------------------------------------------

### 6.1.1 ප්‍රසම්පාදනයන්

-----------------

මධ්‍යස්ථානය විසින් පිළියෙල කර ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලසුම,ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නිර්දේශ අනුව සකස් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ දුර්වලතා සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගබඩා කිරීම, නිශ්චිත බෙදාහැරීමේ ක්‍රමවේදයක් සැලසුම් කිරීම හා රඳවා තබා ගැනීමේදි ඇති විය හැකි පාරිසරික සාධක පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව හදිසි මිලදී ගැනීම් වශයෙන් ඔරු අඟුල් 100 ක් මිලදී ගැනීම සඳහා සංශෝධිත වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම මගින් රු.මිලියන 13 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට ඔරු අගුල් 10 ක් පමණක් භාර ගැනීමට මධ්‍යස්ථානය කටයුතු කර තිබුණි. වටිනාකම රු.11,160,000 ක් වූ ඔරු අගුල් 90 ක් එදිනට සැපයුම්කරු භාරයේ පැවති බව විගණනයේදී නිරික්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77 ක් ප්‍රතිසංස්කරණය හා නඩත්තුව සඳහා ලංසු කරුවන් විසින් විවිධ අයිතම ප්‍රමාණයන් යොදාගනිමින් හා ඇතැම් අයිතම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් තොරව ලංසු ඉදිරිපත් කර තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසුකරුවන් ඉදිරිපත් කර තිබූ මුළු පිරිවැය වටිනාකම යොදාගෙන ලංසු ඇගයීම හේතුවෙන් අවම ලංසුවට වඩා රු.41,993,083 ක් වැඩි වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. තවද ඉදිරිපත් කර තිබූ ලංසු ලේඛනවල පැවති අංක ගණිතමය දෝෂ, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිවැරදිකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානය විසින් ට්‍රැක්ටර් මවුන්ටඩ් පානීය ජල බවුසර් 75 ක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනයෙ දී ට්‍රැක්ටරය සහ ජල බවුසරය එක් විෂයයක් ලෙස සලකා මිල කැඳවීම හේතුවෙන් ඒකකයක් සඳහා රු.1,919,900 ක් වැය කිරීමට සිදුවී තිබුණු අතර එම කාලවකවානුව තුළ දී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින්ද ඉහත ආකාරයේ ට්‍රැක්ටරය සහ ජල බවුසරය සඳහා වෙන වෙනම මිල ගණන් කැඳවා ඒකකයක් රු.1,749,000 ක මිලකට අදාල ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. ඒ අනුව මධ්‍යස්ථානය විසින් ඒකකයක් වෙනුවෙන් රු.170,900 ක් බැගින් ට්‍රැක්ටර් මවුන්ටඩ් පානීය ජල බවුසර් 75 ක් මිලදී ගැනීම සඳහා රු.12,817,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද එළඹ තිබුණු ගිවිසුම අනුව 2017 අප්‍රේල් 03 වන දිනට පෙර ප්‍රසම්පාදනය සම්පූර්ණ කළ යුතු වුවත් එදින වන විට ලැබී තිබුණේ ට්‍රැක්ටර් මවුන්ටඩ් පානීය ජල බවුසර් 55 ක් පමණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී රු.36,348,392 කට මිලදී ගෙන තිබුණු බෝට්ටු 152 ක් සඳහා එන්ජින් නොමැති වීම හේතුවෙන් අදාල කාර්යයන් සඳහා භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණ අතර 2017 මැයි මාසයේදී ඇති වූ හදිසි ගංවතුර අවස්ථාවන් වලදී බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනම මත ලබා ගත් බෝට්ටු සඳහා රු.600,000 ක් ගෙවීමට මධ්‍යස්ථානයට සිදු වී තිබුණි. තවද ආපදාවන් නොපැවති අවස්ථාවක හදිසි මිලදී ගැනීම් වශයෙන් සලකා රු.මිලියන 18.48 ක පිරිවැයකට 2017 ජූනි මාසයේදී බෝට්ටු එන්ජින් 42 ක් මිලදී ගෙන තිබුණි. ඉන් බෝට්ටු එන්ජින් 12 ක් නිකුත් කර තිබුණු අතර බෝට්ටු එන්ජින් 30 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් බෙදා හැරීමට කටයුතු නොකර ගබඩාවේ රඳවා තිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී බහුවිධ ආපදා අවදානම් විශ්ලේෂණ කටයුතු සඳහා රු.5,806,862 ක් වැයකර මෘදුකාංග පරිගණක පද්ධතියක් හා උපකරණ මිලදී ගෙන තිබුණු අතර 2017 වර්ෂයට අදාල ප්‍රතිපාදන වලින් රු.205,200 ක් වැයකර මෙම කාර්යය සඳහා පුහුණු වැඩමුළු පවත්වා තිබුණි. එසේම 2017 වර්ෂයේ මෙම කාර්යය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 53 ක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට භාණ්ඩාගාර අනුමැතිය මත මාරු කර තිබුණු අතර බහුවිධ ආපදා අවදානම් විශ්ලේෂණ කටයුතු නියමිත පරිදි ඉටුකර ගැනීමේ ජාතික අවශ්‍යතාවය පිළිබඳව මධ්‍යස්ථානය නිසි අවධානය යොමුකර නොතිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

----------------------------------------

ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.413,053,476 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදනය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂාවන් වලදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගං වතුර ආපදා අවම කිරීමේ සම්බන්ධ කටයුතු පිළිබඳ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

(i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ කැප්පිටියාව උතුර වසමේ ගලේවෙල වැව රු.මිලියන 04 ක් වැය කර ප්‍රතිසංස්කරණය කර තිබුණ ද වැව් බැම්මේ ඇතැම් ස්ථාන වල ඉදිකර තිබුණු අමුණු ආසන්නයේ යොදා තිබුණු පස් මනාව සුසංහනය කර තණපිඩලි අල්ලා නොතිබුණ බැවින් පස සේදීයාමට ලක් විම හේතුවෙන් වැව් බැම්මේ ආරක්ෂාවට තර්ජනයක් වි තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද අගුණකොලපැලැස්ස දිසාගෙ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ වැඩ විෂයන් 05 ක් වෙනුවෙන් රු. 3,528,725 ක වටිනාකමකට ඉදිකිරීම් ආයතනයක් වෙත පවරා තිබුණි. වටිනාකම රු.2,614,158 ක් වු වැඩ විෂයයන් 02 ක් පමණක් ඉටු කර තිබුණ අතර ඉතිරි වැඩ විෂයන් 03 ඉටුකර නොතිබුණි. උක්ත ව්‍යාපෘතිය යටතේ වැවේ රොන් මඩ ඝන මීටර් 5,112 ක් යන්ත්‍රානුසාරයෙන් ඉවත් කර සැතපුම් ¼ ක් දුරකට ප්‍රවාහනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.2,371,968 ක් ගෙවා තිබුණද වැවෙහි ධාරිතාවය වැඩි වන පරිදි රොන් මඩ ඉවත් කර නොතිබුණු අතර ඉවත් කරන ලද රොන් මඩ වැව දෙපස දමා තිබුණි.

(ආ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගං වතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුබද්ධව සීතා එළිය ගම හරහා දිවෙන ඇළ මාර්ගයේ මීටර් 77 ක කොටසක් රු.1,838,170 ක් වැය කර පුළුල් කර තිබුණ ද මීටර් 30 ක පමණ කොටසක් තව දුරටත් නිම කළ යුතුව පැවතුණු හෙයින් ඇළ මාර්ගය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි

(ii) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුබද්ධව කටුමාන රෝස උයන අභ්‍යන්තර මාර්ගයේ කොන්ක්‍රිට් අතුරා කාණු පද්ධතිය සකස් කරදෙන ලෙස ප්‍රදේශවාසින් ප්‍රාදේශිය ලේකම් වෙත ඉල්ලීමක් කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.1,889,207 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද රු.2,656,000 ක ඇස්තමේන්තුගත මිලකට මාර්ගයේ කාපට් ඇතිරීම සඳහා පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණි.

(ඇ) කෑගල්ල දිස්ත්‍රික්කයේ පානීය ජල ළිං 06 ක ඉදිකිරීම් කටයුතු රු. 1,443,972 වැය කර 2017 නොවැම්බර් වන විට නිම කර තිබුණ ද විගණිත දිනය වු 2018 මැයි 30 දින දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) කොන්ත්‍රාත් වටිනාකම රු.6,788,416 ක් වු බදුල්ල දිස්ත්‍රික්කයේ මීගහකිවුල කරඳගහමඩ අමුණේ ප්‍රතිසංස්කරණ කටයුතු රු.5,713,609 ක් වැය කර 2017 මැයි 17 වන විට අවසන් කර තිබුණද එසේ ප්‍රතිසංස්කරනය කරන ලද ස්ථාන දෙකකින් ජලය කාන්දු වන බව 2018 මැයි 14 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය වී තිබුණි. 2018 අගෝස්තු 02 දින වන විටත් එම අඩුපාඩු පිළිසකර කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී රු.10,776,598 ක් වැය කර මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය නගරයේ ගං වතුර තත්ත්වය අවම කිරීම සඳහා කාණු පද්ධතින් සකස් කර තිබුණු නමුත් වැසි කාලයේ දී මාර්ගය සහ අවට ප්‍රදේශ ජලයෙන් යටවන බව 2018 වර්ෂයේ සිදු කළ භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඊ) 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.32,900,000 ක් වූ අකුරණ නගරයේ ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ විගණන පරීක්ෂණවලදි පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) ව්‍යාපෘතිය යටතේ අකුරණ ප්‍රදේශයේදි පිඟා ඔයේ හා වහගල ඔයේ මඩ ඉවත් කිරීමේ කාර්යයන් එකම කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණු අතර අදාල කොන්ත්‍රාත් ගිවිසුම් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කර නොතිබුණි.

(ii) අදාල ගංගාධාරවල කිලෝ මීටර 20 ක දුරක් ඇතුළත රොන් මඩ කියුබ් 17.116 ක් කැණීම් කර ප්‍රවාහනය කර තිබුණු නමුත් 1992 අංක 35 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත යටතේ අදාල අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

(iii) රොන්මඩ/ පස් සණ මීටර් 3000ක් ප්‍රවාහන කිරීම සඳහා රු.4,850,000 කට (බදු රහිත) කොන්ත්‍රාත් කරුවකු සමග ගිවිසුම් ගත වී තිබුණද සත්‍ය වශයෙන් රොන්මඩ/ පස් සණ මීටර් 4416.78 ක් ඉවත් කළ බව සඳහන් කර ඉදිරිපත් කළ බිල් පත් සඳහා රු.7,088,553 ක් (බදු රහිත) ගෙවීම් කිරීම හේතුවෙන් ගිවිසුම් ගත මුදල ඉක්මවා රු.2,238,553 ක් ගෙවීම් කර තිබුණි.

**6.1.3 ප්‍රමාද වු ව්‍යාපෘති**

-------------------

ගිවිසුම් ප්‍රකාරව 2017 නොවැම්බර් 30 දිනට පෙර අවසන් කළ යුතු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.18,980,088 ක් වු ව්‍යාපෘති 09 ක් නියමිත ප්‍රමිතියෙන් යුතු කුට්ටිගල් සොයා ගැනීමේ අපහසුතාවය මත 2018 පෙබරවාරි 26 දින වන විටත් වැඩ අවසන් කර භාර දී නොතිබුණි.

**6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

-----------------------------------

මධ්‍යස්ථානය විසින් 2014, 2015 හා 2016 වර්ෂ සඳහා වු වාර්ෂික වාර්තා, 2018 ජුනි 19 වන දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

2012 අගෝස්තු 16 දින මධ්‍යස්ථානය සතුව තිබුණු මෝටර් වාහනයක් අනතුරට ලක් වී පුද්ගලයකු මිය යාම හේතුවෙන් අගතියට පත් පාර්ශවය විසින් 2014 අගෝස්තු 07 දින මඩකලපුව දිස්ත්‍රික් අධිකරණයේ මධ්‍යස්ථානයට එරෙහිව නඩුවක් පවරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 7. පද්ධති පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විගණන විමසුම් මාර්ගයෙන් වරින් වර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන අඩුපාඩු කෙරෙහි තවදුරටත් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදනය | i. අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය නොමැතිව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාගැනීම.<br>ii. කාර්ය සාධන බැඳුම්කර හා ලංසු සුරක්ෂණ ලබා නොගැනිම හා ලංසු ලේඛන වල සඳහන් නොමැති නිරීක්ෂණ පදනම්ව ඇගයීම සිදුකර තිබීම.<br>iii. හදිසි ආපදා අවශ්‍යතාවයන්ට උපයෝගී කරගත නොහැකි වන අයුරින් හදිසි අවශ්‍යතා යටතේ මිලදී ගැනීම් සිදුකර තිබීම. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම | මධ්‍යස්ථානයේ සියලුම අංශ නියෝජනය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබීම. |
| (ඇ) | ආපදා අවම කිරීමේ ව්‍යාපෘති | ව්‍යාපෘති වරින් වර වෙනස් කිරීම. |